# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 12,187—1960 අගෝස්තු 26 වැනි සිකුරාදා — 26.8.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**ගමන් ගාස්තු මණ්ඩලය**

**පැමිණ සිටි අය :**

සභාපති, පී. ඕ. ප්‍රනාන්දු මහතා,

ගමන් ගාස්තු මණ්ඩලයේ සභික, කේ. සච්චිදානන්ද මහතා,

ගමන් ගාස්තු මණ්ඩලයේ සභික, පී. ඩී. අභයපාල මහතා,

ගමන් ගාස්තු මණ්ඩලයේ සභික, ඩී. ජී. බී. රණසිංහ මහතා,

ගමන් ගාස්තු මණ්ඩලයේ ලේකම්, ඇස්. ඇස්. එච්. සිල්වා මහතා.

වර්ෂ 1957 අංක 48 දරන ලංකා ප්‍රවාහණ පනත.

වර්ෂ 1959 අංක 1 දරන ගමන් ගාස්තු යෝජනා ක්‍රමය අනුමත කිරීම වස් ලංකා ගමනාගමන මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීම පිළිබඳ කාරණය සම්බන්ධයෙන්—

**අතුරු තීරණය**

1. අපි, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පිළියෙල කර ඇති පරිදි යෝජනා ක්‍රමය අනුමත නො කරමු.

2. අපි වුකලී, මීට යාකර ඇති " අ " අක්ෂරය දරන ලියවිල්ලෙහි දක්වෙන සංශෝධිත යෝජනා ක්‍රමය අනුමත කිරීමට කැමැත්ත දක්වම්හ.

3. සංශෝධිත යෝජනා ක්‍රමයට අඩංගු ගාස්තු ප්‍රමාණයන්ට, එනම්, පහතරට ප්‍රදේශවල නම් එක් මගියකුට සැතැපුමකට ශත 4 ගණනේ ද, උඩරට ප්‍රදේශවල නම් එක් මගියකුට සැතැපුමකට ශත 5 ගණනේ ද වූ ගාස්තු ප්‍රමාණයන්ට අනුව, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් දැනට ප්‍රවාහණ සේවාවන් සැපැයෙන සියළු ම ඔම්නි බස්රථ මාර්ග සඳහා, වැඩි ම ගාස්තු දක්වන චක්‍ර ගමනාගමන මණ්ඩලය විසින් පිළියෙල කොට හැකි ඉක්මණින් ගමන් ගාස්තු මණ්ඩලයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

මේ ගමන් ගාස්තු චක්‍ර ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ලැබුණු විට ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය. මේ ගමන් ගාස්තු චක්‍රවලට විරුද්ධව යමක් කියන්නට තිබේ නම්,

(අ) ජනසතු සේවා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමිති මගින් ; සහ

(ආ) ස්වකීය පාලන සීමාවන් ඇතුළත ඒ වැනි ඔම්නි බස්රථ සේවාවන් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ සැපැයී තිබෙන පළාත් පාලන සභාවලින්

එසේ කළ හැකි ය.

4. ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු පෙන්වා දෙන වාර්තාවක් ගමන් ගාස්තු මණ්ඩලයේ ලේකම්වරයාට සැපැයුව හොත්, විවිධ සේවාවන් සහ පහසුකම් හා සම්බන්ධයෙන්, අප විසින් නියම කරනු ලැබූ වැඩි ම ගාස්තු ප්‍රමාණයන් ගැන, නැවත සලකා බැලීමට අපි සූදානමින් සිටිමු :—

(අ) මේ සේවාවන් සහ පහසුකම් හා සම්බන්ධයෙන් දැනට අය කෙරෙන ගාස්තු.

(ආ) මේ සේවාවන් සහ පහසුකම් හා සම්බන්ධයෙන් ලංකා ගමනාගමන මණ්ඩලය සාධාරණ ය යි සලකන යෝජිත ගාස්තු.

5. මේ අතුරු තීරණය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකරන දිනයෙහි සිට සති තුනක් ඇතුළත, මේ අතුරු තීරණයෙන් මතුවන ඕනෑ ම විෂයයක් පිළිබඳ ව ලංකා ගමනාගමන මණ්ඩලය හෝ වෙන ඕනෑ ම බලයලත් විරුද්ධත්වය ප්‍රකාශ කරන්නකු හෝ ලියවිල්ලකින් සැලකර සිටින සෑම කරුණක් ම කෙරෙහි අපේ සැලකිල්ල යොමු කරමු.

845— ජේ. ඇන්. ආර් 11371—6,447 (8/60)

6. මේ තීරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ද, පහත සඳහන් පුවත්පත්වල ද පළ කළ යුතුය :—

(අ) '' සිලෝන් ඩේලි නිව්ස් '',

(ආ) '' සිලෝන් ඔබ්සර්වර් '',

(ඇ) '' ටයිම්ස් ඔෆ් සිලෝන් '',

(ඈ) දිනමිණ,

(ඉ) ජනතා,

(ඊ) ලංකාදීප,

(උ) '' වීරකේසරී '', සහ

(ඌ) '' තිනකරන් ''.

7. අපි අවශ්‍ය වුවහොත් ප්‍රසිද්ධ විභාගය යළිත් අරඹන්නෙමු. එහෙත් එසේ යළිත් ඇරඹෙන විභාගයේ දී, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පිළියෙල කර ඇති ගමන් ගාස්තු චක්‍ර හා සම්බන්ධයෙන් ඉදිරිපත් කැරෙන කරුණු හැර වෙනත් කරුණු ගැන සලකා බැලීමට බලාපොරොත්තු නොවමු.

පී. ඕ. ප්‍රනාන්දු,
(සභාපති).

කේ. සච්චිතානන්ද,
(සභික).

ඩී. ජී. බී. රණසිංහ,
(සභික).

සෑම් එච්. සිල්වා,
(ලේකම්).

වර්ෂ 1960ටේ අගෝස්තු මස, 16 වැනි දී ය.
කොළඹ 5.

## යා කළ ලියවිල්ල—අ

### ලංකා ගමනාගමන මණ්ඩලය—1959යේ අංක 1 දරන ගමන් ගාස්තු යෝජනා ක්‍රමය.

### I වැනි කොටස

### නම් කිරීම සහ අර්ථ නිරූපණය

**1. නම් කිරීම**

මේ යෝජනා ක්‍රමය, ලංකා ගමනාගමන මණ්ඩලයයේ, වර්ෂ 1959යේ අංක 1 දරන ගමන් ගාස්තු යෝජනා ක්‍රමය යනුවෙන් නම් කළ හැකි ය.

**2. අර්ථ නිරූපණය**

(1) පද සම්බන්ධයෙන් වෙන අන්දමකට තේරුම් ගත යුතු වුවහොත් මිස, මේ යෝජනා ක්‍රමයෙහි පහත් සඳහන් පාඨවල අර්ථ පිළිවෙළින් ඒවාට මෙයින් නියම කර ඇති අරුත් වෙයි :—

'' මණ්ඩලය '' යන්නේ තේරුම ලංකා ගමනාගමන මණ්ඩලය යි.

'' කොන්දේසි '' වලට ව්‍යවස්ථා ඇතුළත් වෙයි.

'' විශෙෂ ගමන් සඳහා කුලියට දීම '' යන්න වර්ෂ 1951කේ අංක 14 දරන මෝටර් රථ ගමනාගමන පනතෙහි 48 (2) වැනි වගන්තියේ '' විටින්විට කෙරෙන සේවා '' යන පාඨය හා සමාන අරුත් ගනියි.

'' ගමන් ගාස්තු දුර '' යන්නේ තේරුම, ගමන් ගාස්තුවක් ගෙවා යතහැකි දුර නියම වන යම් ස්ථානයක සිට ඊළඟ හෝ ඊට පෙර හෝ ගමන් ගාස්තු නියම ස්ථානය දක්වා ඇති දුර ය.

'' ගමන් ගාස්තු නියම ස්ථානය '' යනුවෙන් අදහස් වන්නේ මණ්ඩලය විසින් මේ යෝජනා ක්‍රමයේ 10 වැනි ඡෙදය යටතේ නියම කරන ස්ථානයකි.

'' සාමාන්‍ය ගමන් බඩු '' වලට, යම් මගියකු හා සම්බන්ධයෙන්, ඒ මගියා විසින් සෙසු මගීන්ට කරදරයක් නො වන ලෙස තමා විසින් ම අතින් රැගෙන යන කිසියම් කුඩා බඩු මිටියක්, ද්‍රව්‍යයක්, උපකරණයක් හෝ වෙනත් දෙයක් හෝ ඇතුළත් වෙයි.

'' මාර්ගය '' යනුවෙන් අදහස් වන්නේ ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඔම්නි බස්රථ සේවාවන් සැපැයෙන මහා මාර්ගයේ යම් කොටසකි.

'' වාර ටිකට් පත '' යන්නෙන් අදහස් වන්නේ ටිකට්පත අයත් තැනැත්තාට, නියමිත කාල සීමාවක් තුළ නියමිත මාර්ගයක, ගමන් ගාස්තු නියම ස්ථාන දෙකක් අතර නියමිත ප්‍රමාණයක ගමන් යෑමට ඉඩ ලැබෙන ටිකට් පත ය.

(2) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල අර්ථ නිරූපන ආඥපනතේ 2 වැනි ඡේදෙය, (1 වැනි වෙළුම) මේ යෝජනා ක්‍රමය පාර්ලිමේන්තු පනතක් හැටියට සලකා, ඊට අදාළ වනවා ඇත.

### II වැනි කොටස

### මගීන් ගෙන යාම

**3. වැඩි ම කනි ගමන් ගාස්තු**

(1) මේ යෝජනා ක්‍රමයේ පළමුවැනි උප ලේඛනය ප්‍රකාර විශෙෂ ගමන් පිණිස කුලියට දීමේ ක්‍රමයට ගෙනයනු නො ලබන මගීන් ගෙනයාම සඳහා, මේ යෝජනා ක්‍රමයේ 4 සහ 5 වැනි ඡෙදවල වගන්තීන්ට යටත් ව ගමන් ගාස්තු අය කිරීමට මණ්ඩලයට පිළිවන.

(2) පූරවෝක්ත බස් සේවා යොදවා ඇති මාර්ගවල මගීන් වැඩි සංඛ්‍යාවකට පහසුකම් සැලැසෙන අයුරු මාර්ගයේ ඒ ඒ ස්ථාන අනුව තීරණය කරනු ලබන ගමන් ගාස්තු නියම ස්ථාන ප්‍රකාර යම් ගමන් ගාස්තුවක් අය කළ හැක්කේ යම් දුර ප්‍රමාණයක් ආශ්‍රය කර ගෙනද, ඒ දුර ප්‍රමාණය ගණන් බැලීමට මණ්ඩලයට පිළිවන.

එතකදු වුවත්—

(අ) එකී මාර්ග බෙදා තිබෙන , නියමිත ගමන් ගාස්තු දුර ප්‍රමාණයන් සාමාන්‍යයෙන් දිගින් සැතැපුමකට හෝ සාධාරණයයි හැඟෙන ඊට ආසන්න ප්‍රමාණයකට හෝ නො අඩු විය යුතුය. එසේ ම්,

(ආ) යම් ගමන් ගාස්තු නියම ස්ථානයක් පටන් ගන්නා තැනක සිට මාර්ගය දිගේ මැනීමෙන් ලැබෙන සැතැපුම් 5හේ යම් දුරක් වෙයි නම්, ඊට, මේ යෝජනා ක්‍රමයේ 1 වැනි උප ලේඛනයේ (අ) ඡෙදය අනුව වර්ග කරන යම් මාර්ගයක් හා සම්බන්ධයෙන්, ගමන් ගාස්තු නියම ස්ථාන මුළුමණින්ම 5කට වඩා ඇතුළත් නොවිය යුතු ය ; නැත්නම් මේ යෝජනා ක්‍රමයේ 1 වැනි උප ලේඛනයෙහි (අ) ඡෙදය යටතේ වර්ග කරන යම් මාර්ගයක් හා සම්බන්ධයෙන්, යට කී සැතැපුම් 5හේ දුරට, ගමන් ගාස්තු නියම ස්ථාන මුළුමනින්ම 4කට වැඩියෙන් ඇතුළත් නො විය යුතු ය.

4. ළමයි සහ තරුණ අය

මේ යෝජනා ක්‍රමයෙහි 3 වැනි ඡෙදය තිබුණ ද—

(අ) ගමන් ගාස්තුව ගෙවා යන මගියකු හා සමග ගමන් කරන, වයස අවුරුදු 3ට අඩු ළමයකුගෙන් මණ්ඩලය කිසි ගාස්තුවක් අය නො විය යුතු ය.

(ආ) වයස අවුරුදු 14ට අඩු මගියකු විසින් කෙරෙන යම් ගමනක් හා සම්බන්ධයෙන් එම ඡෙදය යටතේ අය කළ හැකි ගමන් ගාස්තුව, මේ විධිවිධානයෙන් පරිබාහිර ව ඒ යටතේ අය කළ හැකි ව තිබූ ගණනින් දෙකෙන් පංගුවකට වැඩි නො විය යුතු ය.

5. වැඩි ම වාර ටිකට් පත් ගාස්තු

(1) නියමිත මාර්ගයක නියමිත ස්ථාන දෙකක් අතර තනි ගමන් 52ක් යාම සඳහා වාර ටිකට් පත්‍රයක් මිලයට ගැනීමේ දී, මේ යෝජනා ක්‍රමයේ 3 වැනි ඡෙදය අනුව ගණන් බලා එන මුදලකින් සියයට 80කට නො වැඩි ප්‍රමාණයක් අනුව මණ්ඩලය විසින් ගාස්තු අය කිරීමට පුළුවන.

එතකුදු වුවත්—

(අ) මේ ස්ථාන 2 අතර තනි ගමන් ගාස්තුව මේ යෝජනා ක්‍රමයේ 3 වැනි ඡෙදය අනුව ගණන් බැලූ විට රුපියල් 2කට වැඩි නො විය යුතු ය.

(ආ) මේ ඡෙදයේ විධිවිධානයන්ට අනුව මිලයට ගත් වාර ටිකට් පතින්, එහි අයිතිකරුට, දින 45ක් තුළ මේ ස්ථාන 2 අතර තනි ගමන් 52කට නො වැඩි ගණනක් කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(2) මේ ඡෙදයේ 1 වැනි අනු ඡෙදයෙහි විධි විධානයන් තිබුණ ද, වයස අවුරුදු 14ට අඩු මගියකු හා සම්බන්ධයෙන් අය කළ හැකි ගාස්තුව තනි ගමන් 44ක් සඳහා මේ ඡෙදයේ 1 වැනි අනුඡෙදය යටතේ අය කළ හැකි ප්‍රමාණයෙන් දෙකෙන් පංගුවකට වැඩි නොවිය යුතු ය.

(3) මේ ඡෙදයේ 1 සහ 2 වැනි අනුඡෙදවල විධිවිධාන සහ 4 වැනි ඡෙදයේ විධිවිධාන තිබුණ ද, වාර ටිකට් පතක් මිලයට ගන්නා, වයස අවුරුදු 18ට අඩු ශිෂ්‍යයකු හා සම්බන්ධයෙන්, මේ ඡෙදයේ 2 වැනි අනු ඡෙදය යටතේ අය කළ හැකි මුදලට වැඩි නො වන ගාස්තුවක් අය කිරීමට මණ්ඩලයට පිළිවන. එතකුදු වුවත්, ශිෂ්‍යයා ඉගෙන ගන්නා ආයතනයේ ප්‍රධානාචාර්යවරයා හෝ මුල්ගුරුතුමා හෝ අත්සන් කළ සහතිකයක් ඔහු ඉදිරිපත් කළ යුතු ය. ඒ සහතිකයට පහත සඳහන් කරුණු ඇතුළත් කළ යුතු ය :—

(අ) ඔහු වයස අවුරුදු 18 සම්පූර්ණ කර නැති බව සහ වයස අවුරුදු 14 සම්පූර්ණ කර ඇති බව.

(ආ) ඔහු එම ආයතනයේ ශිෂ්‍යයකු බව.

(4) මේ ඡෙදයේ 2 සහ 3 දරන අනු ඡෙදවල කාර්යයන් සඳහා,

(අ) මේ ඡෙදයෙහි විධිවිධානයන්ට අනුව මිලයට ගන්නා වාර ටිකට් පතකින් එහි අයිතිකරුට, දින 30ක් ඇතුළත නියමිත මාර්ගයක නියමිත ස්ථාන 2ක් අතර තනි ගමන් 44ට නො වැඩි ගණනක් කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(ආ) මේ යෝජනා ක්‍රමයේ 4 වැනි ඡෙදය අනුව මේ ස්ථාන 2 අතර ගමනක් සඳහා ගණන් බලන තනි ගමන් ගාස්තුව සත 50කට වැඩි නො විය යුතු ය.

## III වැනි කොටස

6. ගමන් බඩු

(1) මේ යෝජනා ක්‍රමයේ 3, 4 සහ 5 යන ඡෙද යටතේ බලය පැවරී තිබෙන ගමන් ගාස්තු අය කෝට ලංකා ගමනාගමන මණ්ඩලයයේ සේවයන් මගින් ගෙන යනු ලබන මගියකුට කිසි ම අමතර ගාස්තුවක් නො ගෙවා තමන් සමග—

(අ) සෙසු මගීන්ට කරදරයක් නො වන ලෙස මගියා විසින් සියතින් ම රැගෙන යන්නා වූ කිසියම් සාමාන්‍ය ගමන් බඩුවක් හෝ කුඩා බඩු මිටියක් හෝ ද්‍රව්‍යයක්,

(ආ) කුඩා බල්ලකු, කුරුල්ලකු හෝ වෙනත් කරදර ගෙන නොදෙන කුඩා සතකු,

(ඇ) ස්වකීය වෙළඳාම හෝ රක්ෂාව හෝ සඳහා මගියකු උපයෝගී කරගන්නා , පිසූ හෝ නො පිසූ යම් කෑමක් හෝ බීමක්, සහ

(ඈ) කෑම පිණිස ඇති කරන කුකුළු, තාරා ආදි පණ ඇති සතුන්,

ගෙන යත හැකි ය.

එතකුදු වුවත්—

(අ) වාහනයේ කොන්දෙස්තරගේ අවසරය නැති ව බල්ලකු, කුරුල්ලකු හෝ වෙනත් සතකු එහි රැගෙන නො යා යුතු ය.

(ආ) කිසි ම ඔම්නි බස් රථයක වාඩිවීමට පිළියෙල කර ඇති කිසිම කොටසක සාමාන්‍ය ගමන් බඩුවක් හෝ කුඩා බඩු මිටියක් හෝ ද්‍රව්‍යයක් හෝ බල්ලකු හෝ කුරුල්ලකු හෝ සතකු හෝ ගෙන යාමට ඉඩ නො ලැබේ. එසේම, එවැනි ද්‍රව්‍යයකින් පා පුවරුව හෝ ආසන අතර පිහිටි මාර්ගය හෝ අවහිර කිරීමට ද ඉඩ නො ලැබේ.

(ඇ) එවැනි සාමාන්‍ය ගමන් බඩුවක් හෝ කුඩා බඩු මිටියක් හෝ ද්‍රව්‍යයක් හෝ බල්ලකු හෝ කුරුල්ලකු හෝ සතකු හෝ වාහනයේ කොන් දෙස්තර විසින් වාහනයේ නියම කරන තැනක තබා ගෙන යා යුතුය.

(ඈ) එවැනි සාමාන්‍ය ගමන් බඩුවක් හෝ කුඩා බඩු මිටියක් හෝ ද්‍රව්‍යයක් හෝ බල්ලකු හෝ කුරුල්ලකු හෝ සතකු හෝ බරින් රාත්තල් 28කට වැඩි නොවිය යුතු ය.

(2) මේ ඡෙදයේ (1) දරන අනුඡෙදයෙහි සඳහන් වූ සාමාන්‍ය ගමන් බඩුවක්, කුඩා බඩු මිටියක්, ද්‍රව්‍යයක් හෝ කෑම පිණිස ඇති කරන කුකුල් ආදි සතුන් හෝ, බල්ලකු, කුරුල්ලකු හෝ සතකු හෝ ඔම්නි බස් රථයේ ගෙන යාම හේතුකොට ගෙන කිසියම් මගියකුට කිසි කරදරයක් නො වන ලෙස සුදුසු භාජනයක දමා අසුරා තිබුණොත් මිස නැත්නම් කිසි ම ඔම්නිබස් රථයකින් ගෙන නොයා යුතු ය.

(3) කිසි ම පැට්‍රෝලියම් වර්ගයක් හෝ ඉන්ධනයක් හෝ ඇසිඩ් වර්ග, පුපුරණ ද්‍රව්‍ය හෝ වෙනත් අනතුරුදායක හෝ දුගඳ වා විහිදුවන ද්‍රව්‍ය හෝ, මළ සිරුරු හෝ (මිනී පෙට්ටියක දමා වසා හෝ නො දමා හෝ), සුරාබදු ව්‍යවස්ථා වේවා දැනට ක්‍රියාත්මක වන ආහාර පාලන ව්‍යවස්ථා වේවා උල්ලංඝනය කෙරෙන කිසි ම ද්‍රව්‍යයක් කිසිම ඔම්නිබස් රථයක ගෙනයාමට, මේ ඡෙදයෙහි ඉහත සඳහන් කිසි විධිවිධානයකින් ඉඩ ලැබෙයයි සිතා නොගත යුතු ය.

(4) කිසියම් මගියකු විසින් වැඩිපුර ගෙන යන ගමන් බඩුවක් වේ නම් මේ යෝජනා ක්‍රමයේ දෙවැනි උපලේඛනය අනුව නිශ්චය කරන ගණනට වැඩි නොවන ගාස්තුවක් ඒ ගමන් බඩුව සඳහා මණ්ඩලය විසින් අය කිරීමට පුළුවන. මේ ඡෙදයෙහි '' වැඩිපුර ගෙනයන ගමන් බඩු '' යන්නෙන් අදහස් වන්නේ, යම්කිසි මගියකු හා සම්බන්ධයෙන්, බරින් රාත්තල් 28ට වැඩි එහෙත් රාත්තල් 84ට වැඩි නො වන සාමාන්‍ය ගමන් බඩු අසවල් ප්‍රමාණය ය යනුයි ; නැත්නම්, (1) දරන අනුඡෙදය යටතේ වැඩිපුර ගාස්තුවක් නොගෙවා ගෙනයාමට ඔහුට හිමිකමක් නැති යම් ගමන් භාණ්ඩයක් වෙයි නම් එය යි.

## IV වැනි කොටස

### විවිධ සහ පොදු

7. විවිධ සේවා සහ පහසුකම්

පහත සඳහන් විවිධ සේවාවන් සහ පහසුකම් පිළිබඳ ව ලංකා ගමනාගමන මණ්ඩලය විසින් අය කිරීමට පුළුවන් වැඩිම ගාස්තු මෙසේ ය :—

(අ) විශෙෂ මගීන් සඳහා විශෙෂයෙන් සැපැයී තිබෙන හෝ විශෙෂ ගමන් සඳහා කුලියට දෙන හෝ යම් ඔම්නිබස් රථයක් පාවිච්චියට ගැනීම :
බස්රියේ මගීන් සඳහා ඇති ආසන ගණන අනුව එක් මගියකුට සැතැපුමකට සත 5යි.

(ආ) කිසියම් තුරඟ තරඟයක්, ක්‍රීඩා තරඟයක්, උත්සවයක්, ප්‍රදර්ශනයක් හෝ වෙනත් විශෙෂ අවස්ථාවක් හෝ උදෙසා විශෙෂයෙන් සැපැයී තිබෙන ඕනෑම ඔම්නිබස් රථ යක් පාවිච්චියට ගැනීම :
එක් මගියකුට සැතැපුමකට සත 5යි.

(ඇ) මගීන්ට අතිරේක ගාස්තු ගෙවීමෙන් පමණක් ගමන් කළ හැකි හැටියට මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කර ඇති යම් ඔම්නිබස් රථයක් පාවිච්චියට ගැනීම :
එක් මගියකුට සැතැපුමකට සත 5යි.

(ඈ) ආසන කලින් වෙන්කරවා ගැනීම :
එක් ආසනයකට සත 25යි.

(ඉ) කලින් ගමන් බඩු ශෙනයාම හෝ මගියා නොමැතිව බඩු ගෙනයාම :
2 වැනි උපලේඛනයෙහි සඳහන් ගමන් ගාස්තු ම අදළ වෙයි.

(ඊ) ගමන් බඩු කාමරය හෝ තබා යන ගමන් බඩු සඳහා හෝ පහසුකම් :
එක් පාර්සලයකට දිනකට සත 10යි.

8. (1) මේ යෝජනා ක්‍රමයෙහි නියම කර නැති, ඕනෑ ම සේවයකින් සහ ඕනෑ ම පහසුකමකින් ප්‍රයෝජනය ගැනීම උදෙසා, තමන් විසින් තීරණය කරනු ලැබීමට පුළුවන් යම් සාධාරණ ගාස්තුවක් වේ ද, එය අය කිරීමට ලංකා ගමනාගමන මණ්ඩලයට පුළුවන.

(2) මේ ඡෙදයේ (1) වැනි අනුඡෙදයෙහි විධිවිධානයන් යටතේ ලංකා ගමනාගමන මණ්ඩලය විසින් කරනු ලබන හෝ කිරීමට බලාපොරොත්තුවන කිසියම් ගාස්තුවක් වෙයි නම්, එය, එක්කෝ ගමනාගමන මණ්ඩලයේ හෝ නැත්නම් ගාස්තුව ගෙවීමට නියම වී සිටින තැනැත්තාගේ හෝ ඉල්ලුම් කිරීම උඩ ගමන් ගාස්තු මණ්ඩලය විසින් තීරණය කෙරෙනවා ඇත.

**9. වගන්ති සහ කොන්දේසි.**

(1) මේ යෝජනා ක්‍රමය අදළ වෙන යම් සේවාවක් හෝ පහසුකමක් හෝ වෙයි නම් ගමනාගමන මණ්ඩලයට, තමන් විසින් නියම කිරීමට පුළුවන් සාධාරණ වගන්තිවලට සහ කොන්දේසිවලට යටත් ව ඒ සේවාවන් සහ පහසුකම් ප්‍රයෝජනයට ගත හැකිය.

එතකුදු වුවත්—

(අ) මේ යෝජනා ක්‍රමයේ කිසියම් විධිවිධානයකට පටහැණි වන්නාවූ ද,

(ආ) පූර්වෝක්ත සේවයන් හෝ පහසුකම් හෝ ලබාගන්නා කිසියම් තැනැත්තකුගේ මරණය හෝ අනතුරක් හෝ සම්බන්ධයෙන් කෙළින් ම වේවා, නැත්නම් අනියම් වශයෙන් වේවා මණ්ඩලයේ වගකීම බැහැර කිරීම හෝ සීමා කිරීම අදහස් කරන්නා වූ, හෝ

(ඇ) එ වැනි වගකීමක් ක්‍රියාත්මක කළ හැකි කාලය හෝ ක්‍රමය හෝ කෙළින් ම වේවා අනියම් වශයෙන් වේවා නියම කිරීමේ අභිප්‍රාය ඇති, කිසියම් වගන්තියක් හෝ කොන්දේසියක් වෙයි නම් ඒ වගන්තිය හෝ කොන්දේසිය හෝ අවලංගු වේ ; නැත්නම් ක්‍රියාත්මක නොවේ.

(2) මේ ඡෙදයේ (1) වැනි අනුඡෙදයෙන් පැවැරෙන බලතල ක්‍රියාවේ යෙදීමේ දී මණ්ඩලය විසින් පනවනු ලබන හෝ පැනැවීමට බලාපොරොත්තු වන යම් වගන්තියක හෝ කොන්දේසියක හෝ සාධාරණත්වය ගැන ප්‍රශ්නයක් මතු වෙයි නම්, එය ගමන් ගාස්තු මණ්ඩලය විසින් තීරණය කරනවා ඇත.

**10. අය කළ හැකි දුර**

3 වැනි ඡෙදය යටතේ වැඩි ම ගාස්තු අය කිරීමට බලය ලැබී ඇති ඕනෑම ගමනක් හා සම්බන්ධයෙන්, ගමන් ගාස්තු අය කළ හැක්කේ දුර ප්‍රමාණය මෙසේ ගණන් බැලීමෙනි, එනම් :

(අ) මගියා වාහනයට ගොඩවූයේ ගමන් ගාස්තු නියම ස්ථානයක දී නම් ඒ ස්ථානය ද, නියම ස්ථානයක දී හැර ගමන් මාර්ගයේ වෙනත් ස්ථානයක දී වාහනයට ගොඩවුනි නම් ඒ ස්ථානයට පෙර තිබෙන ගමන් ගාස්තු නියම ස්ථානය ද, සහ

(ආ) මගියා වාහනයෙන් බසින්නේ ගමන් ගාස්තු නියම ස්ථානයක නම් එතැනද, මගියා බසින්නේ වෙනත් ස්ථානයක නම් ඒ ස්ථානය පසු කර යන විට ඊළඟට තිබෙන ගමන් ගාස්තු නියම ස්ථානය ද, අතර ඇති දුර ප්‍රමාණය ගණන් බැලීමෙනි.

**11. භාග**

(1) මේ යෝජනා ක්‍රමයේ සියලු ම කාර්යයන් සඳහා සැතැපුම් ½කට වැඩි නොවන දුර ප්‍රමාණයන් ගණන් ගන්නේ සැතැපුම් ½ක් හැටියට ය. සැතැපුම් භාගයකට වැඩි දුර ප්‍රමාණයන් ගණන් ගන්නේ සැතැපුමක් හැටියට ය.

(2) පහත සඳහන් දේ, එනම් :

(අ) කිසියම් විශෙෂ ගමනක් සඳහා අය කරනු වස් මේ යෝජනා ක්‍රමය විසින් බලය දී ඇති (මේ යෝජනා ක්‍රමයේ 3 වැනි ඡෙදය යටතේ බලය ලැබෙන වැඩිම ගමන් ගාස්තුව ද ඇතුළු ව) වැඩිම ගමන් ගාස්තුව,

(ආ) වැඩිපුර ගමන් බඩු සඳහා අය කිරීමට මේ යෝජනා ක්‍රමයේ 6 වැනි ඡෙදය යටතේ බලය දී ඇති වැඩිම ගාස්තුව, සහ

(ඇ) වැඩිපුර ගමන් බඩු සඳහා අය කිරීමට මේ යෝජනා ක්‍රමයේ 7 වැනි ඡෙදය යටතේ බලය දී ඇති වැඩිම ගාස්තුව,

ගැන තීරණය කිරීමේදී සත 5ට අඩු සත 2½ට නො අඩු ගණනක් සත 5 හැටියට ගණන් ගැණෙන අතර, සත 2½ට අඩු ගණන්, අමතක කරනු ලැබේ.

(3) මගීන්ගේ ගමන් බඩුවල බර හා සම්බන්ධයෙන් මේ යෝජනා ක්‍රමයේ 6 වැනි ඡෙදය යටතේ වැඩි ම ගමන් ගාස්තුව තීරණය කිරීමේ කාර්යය සඳහා රාත්තලක භාග රාත්තලක් හැටියට ගණන් ගැණේ.

## V වැනි කොටස

**12. ප්‍රකාශන**

මණ්ඩලය, මේ යෝජනා ක්‍රමයේ පිටපතක් ස්වකීය ප්‍රධාන කාර්යාලයෙහි සහ සෑම ප්‍රාදේශික කලමනාකාරවරයකුගේ, දිස්ත්‍රික් කලමානාකාරවරයකුගේ හා ඩිපෝ මැනේජර් කෙනකුගේ කාර්යාලයෙහි ද ප්‍රදර්ශනය කර තබනවා ඇත. කාර්යාල වේලාව ඇතුළත කිසියම් තැනැත්තකු ඉලලුවහොත් පරීක්ෂා කිරීම සඳහා මෙය ඔහුට ඉදිරිපත් කෙරෙනවා ඇත.

13. ඩිපෝව මගින් පාලනය වන හෝ බස් නැවැතුම් පොළේ සේවය ලැබෙන හෝ සෑම මාර්ගයකම, ගමන් ගාස්තු නියම ස්ථාන සහ ඊට අදළ ව මේ යෝජනා ක්‍රමයේ II වැනි කොටස යටතේ අයකළ හැකි වැඩිම ගමන් ගාස්තු පෙන්වා දෙන ලැයිස්තුවක් හෝ ලැයිස්තු හෝ, මහාජනයාගේ පරීක්ෂාව සඳහා මණ්ඩලය විසින් හැම ඩිපෝවක ම සහ හැම බස් නැවැතුම් පොළකම තබනවා ඇත. යම් හෙයකින් ලංකා ගමනාගමන මණ්ඩලය විසින් අය කිරීමට යෝජනා කරන නියම ගමන් ගාස්තුව, වැඩි ම ගමන් ගාස්තුවට අඩු වෙයි නම් නියම ගමන් ගාස්තුව පෙන්වා දෙන ලැයිස්තුවක් ද මහජනායාගේ පරීක්ෂාව සඳහා තබනවා ඇත.

## 1 වැනි උපලේඛනය

### සැතැපුමකට වැඩිම ගාස්තු

(අ) පහත සඳහන් ප්‍රදේශ යටතට ගැණෙන ඕනෑම මාර්ගයක මගියකු ගෙනයාම සඳහා සැතැපුමකට සත පහයි :—

(1) මහනුවර ආදයම් දිස්ත්‍රික්කය.

(2) නුවරඑළිය ආදයම් දිස්ත්‍රික්කය.

(3) වේරලන්ද-ගලේවෙල–උස්සැත්තැව–නාඋල–ඇලහැර පාරට දකුණින් පිහිටා ඇති, මාතලේ ආදයම් දිස්ත්‍රික්කයට අයත් කොටස.

(4) රඹුක්කන–කෑගල්ල–ගලිගමුව–උඩුගොඩ–දූරණියගල–පරකඩුව පාරට බටහිරින් පිහිටි කොටස හැර, කෑගල්ල ආදයම් දිස්ත්‍රික්කයේ ඉතිරි කොටස්.

(5) පරකඩුව–රත්නපුර පාරට නැගෙනහිරින් ද, ඉංගිරිය–රත්නපුර පාරට දකුණින් ද, හිඳුර–ඇඹිලිපිටිය–ලියනෙගම පාරට උතුරින් ද පිහිටා ඇති, රත්නපුර ආදයම් දිස්ත්‍රික්කයට අයත් කොටස.

(6) වැල්ලවාය–මොනරාගල පාරට උතුරින් ද, අලුත්නුවර–බිබිලේ පාරට බටහිරින් ද, පිහිටා ඇති බදුල්ල ආදයම් දිස්ත්‍රික්කයට අයත් කොටස. එහෙත්, හල්පේ–හල්දුම්මුල්ල–වැල්ලවාය පාරට දකුණින් ද, මොනරාගල–බිබිලෙ පාරට නැගෙනහිරින් ද පිහිටි කොටස්යාශය මීට අයත් වන්නේ නැත.

(ආ) ඉහළ (අ) දරන ඡෙදයෙහි සඳහන් නොවූ ඕනෑ ම ප්‍රදේශයක් ඇතුළත පිහිටි ඕනෑම මාර්ගයක මගියකු ගෙන යාම සඳහා සැතැපුමකට සත 4යි.

## 2 වැනි උපලේඛනය

### වැඩිපුර ගමන් බඩු ගෙනයාම

මගියකුට ගාස්තු නො ගෙවා ගෙන යත හැකි රාත්තල් 28වේ ප්‍රමාණය ඉක්මවා ගෙන යන හැම ගමන්බඩු රාත්තල් 28ට හෝ ඉන් කොටසට හෝ අය වන ගාස්තුව වනුයේ මගියාගේ ගමන් ගාස්තුවෙන් තුනෙන් එකකට සමාන මුදලකි. එහෙත් මෙය ගෙවිය යුතු වන්නේ අඩුම ගණනේ ශත 10ක ගාස්තුව කට යටත්ව ය. (ශත 5න් ඔිනෑම භාගයක් මේ ගණන් බැලීමේ කාර්යයන් සඳහා ශත 5ක් හැටියට සලකනු ලැබේ.)

සෑම රාත්තල් 28ක් සඳහා හෝ ඉන් කොටසක් සඳහා හෝ ඉහත දක්වන ලද පදනම උඩ ගාස්තු ගණන් බලන්නේ මෙසේ ය :—

| මගීන්ගේ ගමන් ගාස්තුව | | | | | ගමන් බඩු සඳහා ගෙවන ගාස්තුව |
|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | | රු. ශ. |
| 0 5 | සිට | 0 30 | දක්වා | ... | 0 10 |
| 0 35 | ,, | 0 45 | ,, | ... | 0 15 |
| 0 50 | ,, | 0 60 | ,, | ... | 0 20 |
| 0 65 | ,, | 0 75 | ,, | ... | 0 25 |
| 0 80 | ,, | 0 90 | ,, | ... | 0 30 |
| 0 95 | ,, | 1 05 | ,, | ... | 0 35 |
| 1 05 | ,, | 1 20 | ,, | ... | 0 40 |
| 1 25 | ,, | 1 35 | ,, | ... | 0 45 |
| 1 40 | ,, | 1 50 | ,, | ... | 0 50 |
| 1 55 | ,, | 1 65 | ,, | ... | 0 55 |
| 1 70 | ,, | 1 80 | ,, | ... | 0 60 |
| 1 85 | ,, | 1 95 | ,, | ... | 0 65 |
| 2 0 | ,, | 2 10 | ,, | ... | 0 70 |
| 2 15 | ,, | 2 25 | ,, | ... | 0 75 |
| 2 30 | ,, | 2 40 | ,, | ... | 0 80 |
| 2 45 | ,, | 2 55 | ,, | ... | 0 85 |
| 2 60 | ,, | 2 70 | ,, | ... | 0 90 |
| 2 75 | ,, | 2 85 | ,, | ... | 0 95 |
| 2 90 | ,, | 3 0 | ,, | ... | 1 0 |
| 3 05 | ,, | 3 15 | ,, | ... | 1 05 |
| 3 20 | ,, | 3 30 | ,, | ... | 1 10 |
| 3 35 | ,, | 3 45 | ,, | ... | 1 15 |
| 3 50 | ,, | 3 60 | ,, | ... | 1 20 |
| 3 65 | ,, | 3 75 | ,, | ... | 1 25 |
| 3 80 | ,, | 3 90 | ,, | ... | 1 30 |
| 3 95 | ,, | 4 05 | ,, | ... | 1 35 |
| 4 10 | ,, | 4 20 | ,, | ... | 1 40 |
| 4 25 | ,, | 4 35 | ,, | ... | 1 45 |
| 4 45 | ,, | 4 50 | ,, | ... | 1 50 |
| 4 55 | ,, | 4 65 | ,, | ... | 1 55 |
| 4 70 | ,, | 4 80 | ,, | ... | 1 60 |
| 4 85 | ,, | 4 95 | ,, | ... | 1 65 |
| 5 0 | ,, | 5 10 | ,, | ... | 1 70 |
| 5 15 | ,, | 5 25 | ,, | ... | 1 75 |
| 5 30 | ,, | 5 40 | ,, | ... | 1 80 |
| 5 45 | ,, | 5 55 | ,, | ... | 1 85 |
| 5 60 | ,, | 5 70 | ,, | ... | 1 90 |
| 5 75 | ,, | 5 85 | ,, | ... | 1 95 |
| 5 90 | ,, | 6 0 | ,, | ... | 2 0 |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.